**#mediaethicsSL #SinhalaPress #lka #Mawbima #July04**

නොමඟ යවන සුළු හෝ සාවද්‍ය අදහසක් සන්නිවේදනය සඳහා ඡායාරූප ඩිජිටල් හෝ වෙනත් ආකාරයකින් සකසා පළ නොකළ යුතුය යන්න ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් ඉදිරිපත් කොට ඇති මාධ්‍ය ආචාර ධර්මයන් අතුරින් එකකි. මව්බිම පුවත්පත මගින් මුල් පිටුවේම පළ කොට ඇති මෙම සේයාරුව සැබෑ එකක් වීමට හෝ නොවීමට පිළිවන. යම් හෙයකින් එය සංස්කරණය කොට විකෘති කරන ලද සේයාරුවක් නම්, එතැන මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් සිදුවී ඇත. එය සංස්කරණය නොකරන ලද සැබෑ ඡායාරූපයක් නම් එහි ගැටළුවක් නැත.